සන්නස

# හද රිදවන මතක සුවඳ



13

ඉන් අඩහෝරාවකට පමණ පසු අප දෙදෙනා හිටියේ ගමේ විහාරස්ථානයේ බෝධි වෘක්ෂයේ අඳුර යට ය. රාත්‍රී දහය පමණ වන්නට ඇති එම වේලාවේ හාත්පස පාළුවේ හා නිහැඬියාවේ ගිලී ගොසිනි. රාත්‍රී දොළහ පසු වූ විට කරුණෙ අයියාගේ මයිනර් කාරය පන්සල් ගේට්ටුව ළඟට එයි. අපි එහි නැඟී පිටව යමු.

කරුණෙ අයියා අප රැගෙන යන්නට වෙලාවටම ආවේය. ඔහු අප අහංගම දක්වා ගෙන ගොස් බස් නැවතුම් පොළෙහි බැස්සවී ය. බසයක නැගී ගාල්ලට ගිය අප දෙදෙනා පාන්දර වනතුරු ගාලු බස් නැවතුම් පොළේම උන්නෙමු. පසුදා පාන්දර අම්බලංගොඩට ගිය අප පූසාගේ සහෝදරියගේ නිවසට ලඟා වීමු. එහි සතියක් පමණ නතරව උන් අප ඇමතිගේ සහචරයන් විසින් පොලිසියට කරන ලද පැමිණිල්ලේ නම් සඳහන් අනෙක් සහෝදරවරුන් සමඟ මාතර උසාවියට භාර වූයෙමු. අප සියලු දෙනාටම රක්ෂිත බන්ධනාගාරයට යාමට සිදුවිය. ඇමතිගේ බල්ලාගේ සිද්ධියෙන් අප රිමාන්ඩ් සිරගෙදර උන් කාලය මාසයකටත් වඩා වැඩි ය.

පූසාත් මමත් එක්ව හිරගෙදරට යන ඊළඟ සිද්ධිය බරපතල එකකි. එය 1982 ජනපති ඡන්දයට දින කිහිපයක් ඉතිරිව තිබියදී සිදු වූ කෝලහලයකි. එහිදී අප වෙත නඟා තිබුණේ වෙඩි තබා මිනිමැරීමට තැත් කිරීම වැනි බරපතල චෝදනාවන් ය. අප රිමාන්ඩ් බන්ධනාගාරයෙහි සිටි කාලය මාස තුනකටත් වඩා අධිකය. එකල මාතර මහේස්ත්‍රාත්ව සිටියේ ආන්දෝලනාත්මක නඩු තීන්දු ලබාදෙන 'මහානාම තිලිකරත්න' විනිසුරු ය. පහළ උසාවියෙන් ඇප ලබාදිය නොහැකි තරම් චෝදනා බරපතළ වූයෙන් ඇප ලබා ගැනීමට සිදුවූයේ ඉහළ උසාවියෙනි. එනම් ශ්‍රේෂ්ඨාධිකරණයෙනි. ඒ සඳහා මූලික වූයේ අධිනීතිඥ ප්‍රින්ස් ගුණසේකර මහතා ය. අප සියලු දෙනාටම ඇප ලැබුණේ මැතිවරණ කොට්ඨාසයට හා පොලිස් බල ප්‍රදේශයට ඇතුළුවීම තහනම් කරන ලද කොන්දේසි කිහිපයකට යටත්ව ය. ඇපපිට නිදහස් වන අප භාර ගන්නට එදා පක්ෂයෙන් පැමිණ සිටියේ 'විජේදාස ලියනාරච්චි' සහෝදරයා ය.

අධිකරණ කටයුතු හා සම්බන්ධ කථාවන්හිදී එක් විශේෂ චරිතයක් සිහිපත් නොකළහොත් එය ගුණමකුකමකැයි සිතමි. එම චරිතය නම් 'චරිත නානායක්කාර' මහතා ය. නීතීඥ චරිත නානායක්කාර මහතා, කොමියුනිස්ට් පක්ෂයේ නායකයෙකු වූද, කුඹුරුපිටිය මන්ත්‍රීවරයාව සිටියා වූද ඊලියන් නානායක්කාර මහතා යටතේ පුහුණු වූ ඔහුගේ කණිෂ්ඨ නීතීඥයා වූ නමුදු මාතර උසාවියට ඉදිරිපත් වියයුතු පක්ෂයේ ඕනෑම සහෝදරයෙකු වෙනුවෙන් පිනී සිටි නීතිඥයා ඔහුය. කිසිමදාක තමාගේ ගාස්තු ගැන වචනයක්වත් කථා නොකළ මේ කරුණාවන්ත නීතීඥයා ගාස්තු දුන්විට පවා ගන්නට මැළිවිය. නීතිඥයෙකුට නොව සිනමා නළුවෙකුට ඔබින රූපයක් තිබූ මෙම නීතිඥ මහතාට භීෂණ සමයේ කුමනාකාර කරදර තිබෙන්නට ඇද්දෝයි මම අද පවා සිතමි.

මා මිත්‍ර 'සරත් ජයනාත්' මවිසින් හැමවිටම සලකන ලද්දේ පක්ෂයේ සහෝදරයෙකු ලෙස නොව මගේ මිත්‍රයා වශයෙනි. මා ඔහුට පූස් කියා අමතන ලද්දේ ද එය ළෙන්ගතු ඇමතුමක් සේ මට හැඟී ගිය බැවිනි.

"සහෝදරයා, ඔහේ සරත් සහෝදරයාට හැම තැනකදීම පූස් පූස් කියන්න එපා.

**මෙම පෝසටර් ඇලවීම සඳහා පූසා යොදා ගත්තේ අපූරු උපක්‍රමයකි. ඔහු තමාට විශ්වාස නගරයේ වෙළඳසැල් හිමියන් දෙතුන් දෙනෙකුට කුඩා පාප්ප ගුලියක් හා පෝස්ටරයක් බැගින් ගෙන ගොස් දෙයි. මෙම දැන්වීම ඇඳ තිබුණේ ටයිප් රයිටර්වලට දමන හාෆ්ෂීට් ප්‍රමාණයේ කොළවලය. මුදලාලි කළයුතු වූයේ රෑ බෝවී කඩය වසද්දී මෙම කොළය තමාගේ කඩේ දොර ලෑල්ල් අලවා ගෙදර යාම ය. නැතහොත් කඩය ඇතුළට වීමය. කඩේ මුදලාලිම තම දොර ලෑල්ලේ පෝස්ටර් අලවා ගනිතැයි සිතන්නේ කවුද ?**

ඒක හොඳ නෑ' අපගේ සංවිධායක සහෝදරයෙක්ව සිටි රණවක සහෝදරයා මට පවසන ලද්දේ වරක් දෙවරක් නොවේ. එහෙත් මගේ මුවට හුරු ඇමතුම එයම විය.

1988 මැද භාගය වනවිට භීෂණ තත්ත්වය පැවතියේ ඉහළම මට්ටමක ය. ගැටවරයෝ සහ තරුණයෝ නොව මැදිවිය පසුකල පිරිමියෙකුවත් ගෙන් පිටත ගියවිට ඔහු නැවත ගෙට ඒම අවිනිශ්චිත දෙයක්ව පැවතිණ. මෙවැනි බිහිසුණු වාතාවරණයක් මධ්‍යයෙහි පවා පූසාත් මමත් ඔහුගේ නිවසේ ඉස්තෝප්පු කාමරයට වී දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ පෝස්ටර් ඇඳීමු.

පූසාගේ නිවස පැරණි පන්නයේ විශාල නිවසකි. ආලින්දයේ බදිරිපස සඳළුතලයක් වැනි අර්ධ කවාකාර කොටසක් ඇත. දිගු ආලින්දය දෙපසම කාමර දෙකකි. මැද සාලය පසුකල විට මැද මිදුලකි. එම මැද මිදුල වටේටම කොරිඩෝවකි. එම කොරිඩෝව වටේ මුළුතැන්ගේ, ඉස්ටෝරු කාමර ආදී කාමර පිහිටා ඇත. අප පෝස්ටර් අඳිමින් සිටියේ දකුණු පසින් වූ ඉස්තෝප්පු කාමරයේ සිටය. පූසාගේ පියා මව හෝ සොයුරියන් අප කුමක් කරන්නේදැයි දැන සිටියේ නැත. මේ ඉස්තෝප්පු කාමරයේ සිට ගෙවත්ත මායිමේ ඇති තාප්පය අසලින්ම දිවයන මාර්ගයට වැඩිම වුණොත් තිබෙන්නට ඇත්තේ අඩි පහළොවක පරතරයකි. හෙවත් යාර පහකි. අප පෝස්ටර් අඳින අතරතුරේදී හමුදා, පොලිස් ට්‍රක් රථ හා ජීප් රථ මෙම මාර්ගය ඔස්සේ ධාවනය වූයේ හඬ දිගේන ය. කිසියම් ඔත්තුවක් ලැබී හෝ සැකයකට මේ හමුදා පොලිස් රථයක් නවත්වා ඔවුන් ගෙට කඩා පැන්නේ නම් අප දෙදෙනාටම උරුම වන්නේ මරණය හැර ඊට අඩු දඬුවමක් නොවේ. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ සාමාජිකයන් කවුදැයි සොයාගත නොහැකිව පිස්සුබල්ලන් මෙන් ඒ මේ අත දුවන හමුදාව හා පොලිසිය මෙම නිවස ගිනිබත් කරන්නට පවා ඉඩ තිබිණ. අප එදා පෝස්ටර් ඇන්දේ අප දෙදෙනාට යාර පහක් තරම් සමීපව රුදුරු මරුවා දත් විලිස්සාගෙන සිටියදී නොවේද ?

මෙම පෝසටර් ඇලවීම සඳහා පූසා යොදා ගත්තේ අපූරු උපක්‍රමයකි. ඔහු තමාට විශ්වාස නගරයේ වෙළඳසැල් හිමියන් දෙතුන් දෙනෙකුට කුඩා පාප්ප ගුලියක් හා පෝස්ටරයක් බැගින් ගෙන ගොස් දෙයි. මෙම දැන්වීම ඇඳ තිබුණේ ටයිප් රයිටර්වලට දමන හාෆ්ෂීට් ප්‍රමාණයේ කොළවලය. මුදලාලි කළයුතු වූයේ රෑ බෝවී කඩය වසද්දී මෙම කොළය තමාගේ කඩේ දොර ලෑල්ල් අලවා ගෙදර යාම ය. නැතහොත් කඩය ඇතුළට වීමය. කඩේ මුදලාලිම තම දොර ලෑල්ලේ පෝස්ටර් අලවා ගනිතැයි සිතන්නේ කවුද ?

පූසාත් මමත් තරුණවිය පසුකරමින් වැඩිහිටියන් පවට පත්වෙමින් සිටි නමුදු අප දෙදෙනාගේ ළමා කාලයේ අප බෙහෙවින් ඇලුම් කළ සුරතල් මත්ස්‍යයින් පිළිබඳ වූ ආශාව අප වෙතින් ගිලිහී නොගොස් තිබුණේ අරුමයකට මෙනි. මාළු ටැංකි සාදා නැවත මාළු ඇති කළ යුතු යැයි යන ආශාව අප දෙදෙනාගේම සිත් තුළ දළු ලා ලියලන්නට විය.

පූසාගේ සහෝදරියගේ සැමියා හෙවත් ඔහුගේ මස්සිනා රාජකාරී කරන ලද්දේ ධීවර සංස්ථාවේ ය. ධීවර සංස්ථාව මගින් මිරිදිය මසුන් ඇති කරන්නට බෙදා දෙන මසුන් අතර කාෆ් වර්ගයේ මතස්‍යයන් සිටින බවත්, මාළු පැටවුන් ලබා ගැනීම සඳහා තංගල්ලේ මුරුතවල පිහිටුවා ඇති මිරිදිය මතස්‍යාගාරයට යා යුතු බවත් පූසා මට පැවසීය. ඔහු සමඟ එහි යන්නට මම ද එකඟ වීමි. මස්සිනාගෙන් ලියුමක් ලබාගත් වහාම එහි යන්නට අප කතිකාකර ගතිමු.

දවසට එක් වරක් හෝ අප නිවසට පැමිණ මා හමුවීම පූසාගේ සිරිත ය. පිට පිට දින දෙකක්ම ඔහු නොපැමිණියෙන් ඔහු අසනීපයෙන් වන්නට ඇතැයි මත සිතීමි. ඔහු සොයා ඔහුගේ නිවසට ගිය මට අසන්නට ලැබුණේ විස්මිත ප්‍රවෘත්තියකි.

ඔහු දින දෙකකට පෙර උදෑසනම මාළු පැටව් ගෙන ඒම සඳහා මුරුතවෙල බලා ගොස් තිබේ. මේ දක්වා පැමිණ නැත. ඔහුගේ සහෝදරියක් රාජකාරී කරන කන්තෝරුවට අද දවස පුරා වරින් වර දුරකථනයෙන් කථාකළ පුද්ගලයෙකු අයියා වැලිගම සිට මුරුතවෙල පැමිණයේ කුමක් සඳහාද ? ආදී විවිධ ප්‍රශ්ණ නගා තිබේ. ඔහු විශේෂයෙන් ප්‍රශ්න නගා ඇත්තේ පූසා ගෙන ගොස් ඇති හිස් ගමන් මල්ල ගැන ය. (ට්‍රැවලිං බැගය) ඔහු එම බෑගය ගෙන ගොස් ඇත්තේ පොලිතින් බෑග්වල දමාගත් මාළු පැටවුන් ආරක්ෂාකාරී ලෙස රැගෙන එනු සඳහා ය. ඒ අතරේදී අද දහවලේදී පූසාගේ නිවසට ටැංකි තිබේද ? ආදී ප්‍රශ්න නගා තිබේ. එම ගමන යන්නට හිටියේ අප දෙදෙනාම වුවත්, ඔහු ගිය ගමන ගැන මා පවා නොදන්නා බව පූසාගේ ගෙදර ඇත්තෝ දැනගත්තේ මා කියූ පසුවය.

ඊළඟ දිනයේදී දුරකථනයෙන් ප්‍රශ්න නගන්නා ඔහුගේ සහෝදරියන්ගෙන් ප්‍රශ්න නගා ඇත. සරත්ගේ වැඩිහිටියෝ මුරුතවෙල මිරිදිය මාළු මධ්‍යස්ථානයට ගොස් කරන ලද සොයා බැලීම්වලදී දැනගෙන ඇත්තේ ඔහු එහි පැමිණි බවය. එහෙත් එම ප්‍රදේශයේ එදින කලබල පැවතියෙන් මිරිදිය මතස්‍යාගාරය වසා තිබී ඇත. ඒ අසල වූ වෙළඳසැලක මුදලාලි පවසා ඇත්තේ ඔහු කඩයට ද පැමිණි තේ බී බසයක් එනතුරු බොහෝ වේලාවක් බලා සිටි බවය.

තෙවන දිනයෙන් පසු දුරකථනයෙන් කරන ප්‍රශ්න නැඟීම් ද නතර විය. පූසාගේ අතුරුදහන් වීම ගැන දන්නේ මමත් ඔහුගේ නිවසේ අයත් බවක් වුවද ප්‍රදේශයේ ආණ්ඩු පක්ෂ බලධාරියාගේ හෙන්චයියෝ ඔවුන් පතුරුවන ලද ආරංචියක් වූයේ සරත්ගේ මළකඳ තංගල්ලේ හෝ හම්බන්තොට බස් නැවතුම්පළේ පිලිස්සෙමින් තිබෙන බවය. හඬා වැලපෙමින් වහාම එම ප්‍රදේශවලට ගොස් සෝදිසි කළ ඔහුගේ වැඩිහිටියන්ට එවැන්නක් දැකගත හැකි වූයේ නැත.

එම ගමන යන්නට හිටියේ අප දෙදෙනාම ය. එහෙත් මටද හොරෙන් ඔහු ඒ ගමන ගියේ තනිවම ය. මාද ඔහු සමඟ ගියේ නම් ඔහුට අත්වන්නට ඇති ඉරණම මට ද අත්වීම නොවැළැක්විය හැක්කකි. දින සති මාස ගණන් ගත වුවද පූසා යළි ආවේ නැත.

හෝඩියේ පන්තියේ සිට බැඳුණ මිතුරුදම දේශපාලන ගමන් මගේ ද නොබිඳිමින් මා සමඟ හිරගෙවල්වල තැපීමට ද ආ ඔහු එක්ව යන්නට කතිකා කරගෙන සිටි මෙම ඉරණම් ගමන තනිවම ගියේ කුමණ හැඟිමකින් මෙහෙය වනු ලැබීමෙන් ද ? මේ යන්නේ අවදානම් ගමනක් බවත් අවුරුදු දෙකක කුඩා දරුවෙකුගේ පියෙකු වන ඔහුගේ මිත්‍රයා වන මා අනතුරැක නොහෙලිය යුතු බවත් ඔහුට හැඟී ගියේද ?

මා මෙම සටහන ලියනවිට පූසා අතුරුදහන් වී වසර දහඅටක්ම ගතව ගොස් තිබේ.

අප දෙදෙනා වසර අවුරුදු දහයේ දොළහේ ළමයින්ව සිටියදී අග්‍රබෝධි රජමහා විහාරය අසලින් දිවෙන ගුරුපාරට ගොස් සිගරැට්ටුවක් හොරෙන් බී ජේර් කොළ හපා ගෙදර ආ අයුරු මට මේ දැන් පවා සිහිපත් වෙයි. ඔහුගේ සීයාගේ සිගරට් පැකැට්ටුවෙන් ත්‍රී රෝසස් සිගරැට්ටුවක් හොරකම් කරගෙන ආවේ පූසාය. මා ගෙන ගියේ අපේ ගෙදර කුස්සියේ තිබූ අලියා ගිනිපෙට්ටියයි.

*ලබන කලාපයට*

රෝහිත මුණසිංහ
ප්‍රංශයේ සිට